# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1786/22 - 2012 නොවැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2012.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**සමථ මණ්ඩල කොමිෂන් සභාව**

සමථකාරවරුන් ලෙස පත් කිරීම සඳහා නාම යෝජනා කැඳවීමේ නිවේදනය

පහත දක්වා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඃ එනම්,

| *දිස්ත්‍රික්කය* | *සමථ මණ්ඩල ප්‍රදේශය* |
|---|---|
| මඩකලපුව | කෝරලෙයිපත්තු මධ්‍යම, වාලච්චේනෙයි |

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ විධිවිධාන බලතල සමථ මණ්ඩල ප්‍රදේශ වශයෙන්, ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් සිය නියමය මඟින් සඳහන් කර ඇති හෙයින්,

එකී සමථ මණ්ඩල සඳහා සමථකාරවරුන් පත්කිරීම පිණිස සුදුසුකම් ඇති තැනැත්තන්ගේ නම් ඉදිරිපත් කරන ලෙස මෙහි පහත සඳහන් කර ඇති (අ) පුද්ගලයින්ගෙන් (ආ) මණ්ඩලවලින්, දේශපාලනමය නොවන සංවිධානවලින් සහ ආයතනවලින් හා (ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් /ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව මෙයින් ඉල්ලා සිටී.

(අ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා තමන්ගේ ම හැර අන් අයගේ නාම ඉදිරිපත් කිරීමට පහත සඳහන් පුද්ගලයින්ට හිමිකම් ඇත්තේ ය :–

(i) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි කාර්යාලයක නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු හෝ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන රාජ්‍ය නිලධාරියකුට හෝ පළාත් සභා රාජ්‍ය නිලධාරියෙකුට ;

(ii) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පිහිටි ආගමික පූජනීය ස්ථානයක හෝ පාසලක ප්‍රධානියෙකුට ;

(iii) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචි ව සිටින විශ්‍රාම ලත් දෙපාර්තමේන්තු හෝ පාඨශාලා ප්‍රධානියෙකුට ;

(ආ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට පහත සඳහන් මණ්ඩලවලට සංවිධානවලට සහ ආයතනවලට හිමිකම් ඇත්තේ ය :–

(I) යටත් පිරිසෙයින් අවුරුදු පහක් තිස්සේ පවතින්නා වූ ද, පහත සඳහන් අරමුණු එකක් හෝ වැඩි ගණනක් ඉටු කරන්නා වූ හෝ ඒ සම්බන්ධ මෙහෙයක් කරන්නා වූ යම් මණ්ඩලයකට, සංවිධානයකට හෝ ආයතනයකට :–

(අ) සමාජයේ අධ්‍යාපනික, ආගමික, සදාචාරාත්මක හෝ අධ්‍යාත්මික වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා ;

(ආ) සමාජ සුභසාධනය වර්ධනය කිරීම හෝ දුගී බව තුරන් කිරීම සඳහා ;

(ඇ) ග්‍රාමීය හෝ ප්‍රජා සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා ;

(ඈ) සංස්කෘතික හෝ ක්‍රීඩා වැඩි දියුණු කිරීම සඳහා ; සහ

(ඉ) සෞඛ්‍ය, ආහාර හා නිවාස වැනි ජනයාගේ මූලික අවශ්‍යතාවයන් සැලැස්වීම සහ සපයාදීම අරමුණු කරගත් ව්‍යාපෘති, වැඩ සටහන් සහ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා.

(ඇ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට/ ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමිකම් ඇත්තේ ය :–

(I) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා තිබෙන පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරුන්ට,

(II) යම් සමථ මණ්ඩල ප්‍රදේශයකට, බල මණ්ඩලයට පත්වීමක් ලැබීමට හිමිකම් ඇත්තේ පහත සඳහන් තැනැත්තන්ට බැවින්, ඔවුන්ගේ නම් පමණක් පත්වීම පිණිස යෝජනා කළයුතු වේ :–

එනම්,

(අ) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචි ව සිටින හෝ එම ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින තැනැත්තන් ;

(ආ) අති විශේෂ අවස්ථාගත කරුණුවල දී කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් එම සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත පදිංචි ව සිටින හෝ එම ප්‍රදේශයෙන් පිටත යම් වැඩක යෙදී සිටින තැනැත්තෙක් ; සහ

(ඇ) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරියෙක් එසේ නම් කරනු ලබන නිලධාරියෙක් එම පරිපාලන දිස්ත්‍රික්කය ඇතුලත තිබෙන සෑම සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයකට පත්වීමක් ලැබීමට සුදුසුකම් ඇත.

(III) (අ) ඉහත I වැනි ඡේදයේ සඳහන් වන පුද්ගලයින් සහ මණ්ඩල, සංවිධාන සහ ආයතනවලට II (අ) සහ II (ආ) ඡේදවල දක්වා ඇති රාජ්‍ය නිලධාරින් නොවන තැනැත්තන්ගේ නම් ඉදිරිපත් කළ හැකි ය. එසේම පළාත් සභා රාජ්‍ය නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කිරීමට ද ඔවුන්ට හැකිවේ. කිසියම් පුද්ගලයෙකුට තමන්ගේ ම නම යෝජනා කර ගැනීමට නොහැක ;

(ආ) ඉහත I ඡේදයේ සඳහන් කර ඇති දිස්ත්‍රික් ලේකම්වරුන්ට රාජ්‍ය නිලධාරින්ගේ නම් ඉදිරිපත් කළ හැකි අතර, ඒ අයගෙන් පස් දෙනෙකුට නොවැඩි ගණනක් කොමිෂන් සභාව විසින් අදාළ සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කළ හැකි ය.

(IV) නාම යෝජනා කිරීමේ ආකෘති පත්‍රය :

(අ) පුද්ගලයින් විසින් නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ පහත දැක්වෙන 'අ' ආකෘති පත්‍රයට අනුකූලව ය;

(ආ) මණ්ඩල, සංවිධාන සහ ආයතන විසින් නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ආ' ආකෘති පත්‍රයට අනුකූලව ය;

(ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ 'ඇ' ආකෘති පත්‍රයට අනුකූලව ය.

එක් එක් නාම යෝජනාව වෙන ම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කළයුතු අතර, මීළඟ ඡේදයේ දක්වා ඇති පරිදි නාම යෝජනා ඉදිරිපත් කරන අයගේ නිර්දේශය ද නොවරදවා ම එහි ඇතුළත් කළ යුතු ය :–

(V) නාම යෝජකගේ නිර්දේශය හේතු රහිත නිර්දේශයක් නොවිය යුතු ය. සමථකාරවරුන්ගේ මූලමණ්ඩලයට පත් කිරීම සඳහා යෝජනා කරන තැනැත්තාගේ යෝග්‍යතාවය හෝ අයෝග්‍යතාවය පිළිබඳ ව සිය නිශ්චයට එළඹීමට කොමිෂන් සභාවට හැකි වන පරිදි නිශ්චිත කරුණු එම නිර්දේශයේ දැක්විය යුතු ය. උදාහරණයක් වශයෙන් ඔහුගේ / ඇයගේ වර්තමාන හෝ කලින් රක්ෂාව, එම වෘත්තියේ

සේවය කළ නැතහොත් යෙදී සිටි කාල පරිච්ඡේදය, ඔහු / ඇය විසින් දරන ලද යම් විශ්වාස හෝ වගකීම් සහිත තනතුරක් හෝ ඔහු/ඇය විසින් යම් සමාජ සේවා, ආගමික පුණ්‍ය සංවිධානයක, සංගමයක, මණ්ඩලයක දරන ලද නිලය තිබේ නම් එය ද සඳහන් කළ යුතු ය,

(VI) කිසියම් පුද්ගලයෙක් හෝ මණ්ඩලයක්, සංවිධානයක් හෝ ආයතනයක් එකම සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාම යෝජනා තුනකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙන් හැකි තරම් දුරට වැළකී සිටිය යුතු ය,

(VII) සියලුම නාම යෝජනා, 2013 ජනවාරි මස 15 වැනි දිනට හෝ ඊට පෙර, කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණය, අධිකරණ අමාත්‍යාංශයේ 03 වැනි මහලේ පිහිටි සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන පරිදි එවිය යුතු ය.

කොමිෂන් සභාව විසින් සිය මතය අනුව සමථකරණ දක්ෂතා සහ ක්‍රම පිළිබඳ ප්‍රාථමික පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යෝග්‍ය සුදුසුකම් ඇති තැනැත්තන් මුලින් තෝරා ගනු ඇත.

වාසනා පී. ගුණරත්න,
ලේකම් (වැ. බ.),
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2012 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ 12,
උපරිමාධිකරණ සංකීර්ණය,
අධිකරණ අමාත්‍යාංශය,
03 වැනි මහල,
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**'අ' ආකෘති පත්‍රය**

(නාම යෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයන් විසින් පිරවීම සඳහා)

1. සමථ මණ්ඩල ප්‍රදේශය :—————,
2. පරිපාලන දිස්ත්‍රික්කය :—————,
3. නාම යෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයා පිළිබඳ විස්තර :

(අ) ඔබගේ සම්පූර්ණ නම :—————,
(ආ) ඔබගේ පදිංචි ලිපිනය :—————,
(ඇ) ඔබ නාම යෝජනාව ඉදිරිපත් කරන්නේ කුමන තත්ත්වයෙන් ද යන බව :

(i) ඔබ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නම් මේවා සඳහන් කරන්න :
දෙපාර්තමේන්තුවේ නම :—————,
ඔබගේ කාර්යාලයේ පිහිටීම :—————,
ඔබ දරන තනතුර :—————,

(ii) ඔබ පූජනීය ස්ථානයක ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? නැතහොත් පාසලක ප්‍රධානියෙක් ද? එසේ නම් මේවා සඳහන් කරන්න :
එහි නම :—————,
එහි පිහිටීම :—————,
ඔබ දරන ලද තනතුර :—————,

(iii) ඔබ විශ්‍රාම ලත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් විශ්‍රාම ලත් පාඨශාලා ප්‍රධානියෙක් ද? එසේ නම් මේවා සඳහන් කරන්න ඃ
එහි නම :—————,
ඔබ අන්තිම වරට දරන ලද තනතුර :—————,
ඔබ පදිංචි ව සිටින සමථ මණ්ඩල ප්‍රදේශය :—————,

4. ඔබ විසින් නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර ඃ
(අ) ඔහුගේ සම්පූර්ණ නම :—————,
(ආ) ඔහු පදිංචි ලිපිනය :—————,

(ඇ) ඔහු පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? :——————,

(ඈ) ඔහු එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද?:——————,

(ඉ) ඔබගේ නිර්දේශය ඊට හේතු ද සහිතව සඳහන් කරන්න. :——————.

——————

අත්සන,

(මුද්‍රාව තිබේ නම්)

දිනය :——————

**'ආ' ආකෘති පත්‍රය**

(නාම යෝජනා කිරීමට සුදුසුකම් ඇති මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ ලේකම් විසින් පිරවිය යුතු ය.)

1. සමථ මණ්ඩල ප්‍රදේශය :——————.
2. පරිපාලන දිස්ත්‍රික්කය :——————.
3. නාම යෝජනාව ඉදිරිපත් කරන මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය පිළිබඳ විස්තර :

(අ) එහි නම :——————,

(ආ) එහි ලියාපදිංචි/රාජකාරි ලිපිනය :——————,

(ඇ) එය ලියාපදිංචි කරන ලද හෝ පිහිටුවන ලද දිනය :——————,

(ඈ) එය කොතරම් කාලයක සිට පැවතෙන්නේ ද යන බව :——————,

(ඉ) එයින් ඉටු කෙරෙන අරමුණ හෝ සිදුවන මෙහෙය :——————.

4. නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර :

(අ) ඔහුගේ සම්පූර්ණ නම :——————,

(ආ) ඔහු පදිංචි ලිපිනය :——————,

(ඇ) ඔහු පදිංචි ව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? :——————,

(ඈ) ඔහු එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? :——————,

(ඉ) ඔහු රාජ්‍ය නිලධාරියෙකු ද? එසේ නම් ඔහු දරන තනතුර සඳහන් කරන්න :——————.

5. අදාළ මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය ඔහුගේ නාම යෝජනාවට අවසර දෙමින් යෝජනාවක් සම්මත කර ඇද්ද ? එසේ නම් එම යෝජනා සම්මතයේ දිනය සඳහන් කරන්න :——————.

6. මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ නිර්දේශය ද ඊට හේතු ද සමග සඳහන් කරන්න :——————.

——————

ලේකම්.

(මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ මුද්‍රාව)

දිනය :——————

**'ඇ' ආකෘති පත්‍රය**

(නාම යෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති දිසාපති විසින් පිරවිය යුතුය)

1. සමථ මණ්ඩල ප්‍රදේශය :——————.
2. පරිපාලන දිස්ත්‍රික්කය :——————.
3. නාම යෝජනාව ඉදිරිපත් කරන දිසාපති පිළිබඳ විස්තර :

    (අ) ඔබගේ සම්පූර්ණ නම :——————,
    (ආ) ඔබගේ රාජකාරී ලිපිනය :——————,
    (ඇ) ඔබ දිසාපතිව සිටින්නේ කුමන දිස්ත්‍රික්කයක ද? :——————.

4. නාම යෝජනා කරනු ලබන නිලධාරියාගේ විස්තර :

    (අ) ඔහුගේ සම්පූර්ණ නම :——————,
    (ආ) ඔහු රාජ්‍ය නිලධාරියෙක් ද? එසේ නම් ඔහු දරන තනතුර සඳහන් කරන්න :——————,
    (ඇ) ඔහුගේ රාජකාරී ලිපිනය/පුද්ගලික ලිපිනය :——————.

5. ඔබගේ නිර්දේශය සහ ඊට හේතු ද සහිත ව සඳහන් කරන්න :——————.

——————
අත්සන.
(මුද්‍රාව තිබේ නම්)

දිනය :——————

12-344

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.